# තරුණ විද්‍යාඥයන්ගේ
## 07 වැනි පර්යේෂණ සමුළුව සාර්ථකයි

**- ප්‍රදීප් පියතිලක -**

ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව (National Science & Technology Commision) මගින් ක්‍රියාත්මක වන "තරුණ විද්‍යාඥයන්ගේ සංසදයේ" (Young Scientists's Forum (YSF) 7 වැනි වාර්ෂික පර්යේෂණ සමුළුව වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාවහාරික විද්‍යා පීඨයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පසුගිය ජනවාරි මස 19 වැනි දින පවත්වන ලදි. එහි ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස වයඹ විශ්වවිද්‍යාලයේ, උප කුලපති මහාචාර්ය ඊ.එම්. පී.ඒකනායක මහතා සහභාගී විය. සමාරම්භක උත්සවයේ ආරාධිත දේශනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය චලින්ද බෙතෙරගම මහතා විසින් සිදු කරන ලදී. මේ පර්යේෂණ සමුළුවේ දී ජෛව රසායන විද්‍යාව සහ රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂි විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යාව, අනුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය, ආහාර විද්‍යාව සහ පෝෂණය, භෞතික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, නැනෝ තාක්ෂණය සහ ආර්ථික විද්‍යාව, සංඛ්‍යානය, මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා යන ප්‍රධාන අංශවලට අයත් පර්යේෂණ පත්‍රිකා 50ක් පමණ තරුණ විද්‍යාඥයන් විසින් ඉදිරිපත් කරන ලද අතර, එක් එක් අංශයේ හොඳම පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීම් සඳහා කුසලතා සහතික පිරිනමන ලදි.

*03 වැනි පිටුවට...*



